2024.09.02

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2024
## ඉතිහාසය

Learning Resource Center
R
De Mazenod College
Kandana

විභාග අංකය :.........................................

| 6 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) දීපවංසය අයත්වන මූලාශ්‍ර වර්ගය වන්නේ
(i) සාහිත්‍ය මූලාශ්‍ර (ii) සෙල්ලිපි (iii) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර (iv) භානක මූලාශ්‍ර

(02) මහාවංසයේ කතුවරයා වන්නේ
(i) මහින්ද හිමි (ii) මහානාම හිමි (iii) වෑත්තෑවේ හිමි (iv) රාහුල හිමි

(03) ශක වර්ෂ ක්‍රමය භාවිත කරන ලද ආගමික ජන කණ්ඩායම වන්නේ
(i) ඉස්ලාම් (ii) බෞද්ධ (iii) ක්‍රිස්තියානි (iv) හින්දු

(04) හිජ්රි වර්ෂ යනු
(i) ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තිය සිදු වීමට පෙර කාලය
(iii) බුදුන් වහන්සේගේ මහා පරිනිර්වාණය සිදු වූ දින සිට ආරම්භ වන වර්ෂ ක්‍රමය
(ii) ඉන්දියාවේ බටහිර ප්‍රදේශය පාලනය කළ ගෞතමිපුත්‍ර සාතකර්ණි රජු විසින් ආරම්භ කළ වර්ෂ ක්‍රමය
(iv) මුස්ලිම්වරුන් තමන්ගේ ආගමික උත්සව පැවැත්වීමේ දී කාලය මැන ගැනීමට භාවිත කරන වර්ෂ ක්‍රමය

(05) ලෝකයේ මුල් ම ජීවීන් බිහි වූයේ
(i) ගොඩබිමේ (ii) ජලයේ (iii) අහසේ (iv) විශ්වයේ

(06) මහා හිම යුගය ලෙස හැඳින්වූයේ
(i) ශ්‍රී ලංකාවේ පැවති අධික සීතල දේශගුණය (iii) උත්තර ධ්‍රැවයේ පවතින හිම පතනය
(ii) පෘථිවියේ පැවති අධික සීතල දේශගුණය (iv) ඇන්ටාක්ටික් ප්‍රදේශවල පවතින හිම කඳු

(07) ශාක වර්ග ගොඩබිමේ පැතිරී ගිය යුගය හඳුන්වන්නේ
(i) සිලූරියන (ii) හොලෝසීන (iii) පැලියොසොයික (iv) පුරාසික

(08) මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා හැඳින්වූයේ
(i) ඔස්ට්‍රලෝපිතිකස් (ii) ඉරෙක්ටස් (iii) නියන්ඩතාලන්සිස් (iv) හැබිලස්

(09) ආදි මානවයා විසින් ඇටසැකිලි මත වර්ණ ආලේප කිරීම සිදු කර ඇති යුගය වන්නේ
(i) යකඩ යුගය (ii) නවශිලා යුගය (iii) මධ්‍යශිලා යුගය (iv) පුරාශිලා යුගය

(10) වී වගාව මුල් වරට ආරම්භ වූයේ
(i) ජපානයේ (ii) චීනයේ (iii) ඉන්දියාවේ (iv) ඇමරිකාවේ

(11) වර්තමානයේ ජීවත්වන මානවයා හඳුන්වන්නේ
(i) ) හෝමෝ නියන්ඩතාලන්සිස් (ii) හෝමෝ හැබිලස් (iii) හෝමෝ ඉරෙක්ටස් (iv) ) හෝමෝ සාපියන්

- (12) - (14) දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් රූප සටහන් ඇසුරෙන් පිළිතුරු ලියන්න.

A 

B 

(12) 'A' රූපසටහනේ දැක්වෙන මානව වර්ගය වන්නේ
(i) කොකසොයිඩ් (ii) නීග්‍රොයිඩ් (iii) ඔස්ට්‍රලොයිඩ් (iv) මොන්ගොලොයිඩ්

(13) 'B' රූපසටහනේ දැක්වෙන මානව වර්ගය වන්නේ
(i) කොකසොයිඩ් (ii) නීග්‍රොයිඩ් (iii) ඔස්ට්‍රලොයිඩ් (iv) මොන්ගොලොයිඩ්

(14) 'A හා B' රූපසටහනේ දැක්වෙන මානව වර්ග ජීවත්වන රටවල් නිවැරදිව දක්වා ඇත්තේ
(i) ඇමරිකාව හා ඕස්ට්‍රේලියාව
(ii) ජපානය හා ඉන්දියාව
(iii) අප්‍රිකාව හා චීනය
(iv) රුසියාව හා කොරියාව

(15) මෙසොපොතේමියානු ශිෂ්ටාචාරය දියුණු වූ ගංගා නිම්න වන්නේ
(i) නයිල් ගඟ
(ii) යුප්‍රටීස් සහ ටයිග්‍රිස් ගංගා
(iii) හොවැංහෝ ගඟ
(iv) ඉන්දු ගඟ

(16) ලෝකයේ පැරණිතම නීති පොත සකස් කරන ලද ශිෂ්ටාචාරය වන්නේ
(i) ඉන්දු (ii) ඊජිප්තු (iii) මෙසොපොතේමියානු (iv) චීන

(17) පාරාවෝ නමින් හැඳින්වෙන රජ පෙළපතක් පාලනය කරන ලද ශිෂ්ටාචාරය වන්නේ
(i) ඊජිප්තු (ii) චීන (iii) ඉන්දු (iv) මෙසොපොතේමියානු

(18) ජලකාණු ළිං හා අපද්‍රව්‍ය බැහැර කරන නල පද්ධතියක් නිර්මාණය කර ඇති ශිෂ්ටාචාරය වන්නේ
(i) ඉන්දු (ii) ඊජිප්තු (iii) මෙසොපොතේමියානු (iv) චීන

(19) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මුද්‍රාවල දක්නට ලැබෙන සත්ත්වයෙක් වන්නේ
(i) අලියා (ii) දිවියා (iii) රයිනෝසිරස් (iv) කොටියා

(20) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය අයත්වන වර්තමාන රට වන්නේ
(i) ඉරාකය (ii) ඉරානය (iii) අරාබිය (iv) තුර්කිය

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) අ) පහත දැක්වෙන ලෝක සිතියම ඇසුරෙන් පිළිතුරු සපයන්න.



(i) A අක්ෂරයෙන් දැක්වෙන ශිෂ්ටාචාරය බිහිවූයේ කුමන ගංගා නිම්නයක් පදනම් කරගෙනද? (ලකුණු 02)

(ii) ඉන්දු ගංගාව හා නයිල් ගංගාව දැක්වෙන අක්ෂර නම් කරන්න. (ලකුණු 02)

(iii) අංක 1න් දක්වා ඇති ශිෂ්ටාචාරය කුමක්ද? (ලකුණු 02)

ආ) පහත දැක්වෙන පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න.



01. (i) මෙම පින්තූරයෙන් නිරූපනය වන්නේ කවුද?

(ii) මෙම නිර්මාණය අයත් වන්නේ කුමන ඓතිහාසික යුගයකටද?

(iii) මෙය සකස් කර තිබෙන්නේ කුමන ද්‍රව්‍යයක් උපයෝගී කරගෙනද?



02. (i) මෙම පින්තූරයෙන් නිරූපනය වන්නේ කවුද?

(ii) මෙය නිර්මාණය කරන ලද්දේ කුමන ශිෂ්ටාචාරයකද?

(iii) මෙය නිර්මාණය කර ඇති ලෝහ වර්ගය කුමක්ද?

(02) 1. ඉතිහාසය යනු කුමක්ද? කෙටියෙන් දක්වන්න. (ලකුණු 02)

2. ඉතිහාසය ඉගෙනීමට ප්‍රයෝජනවත් වන මූලාශ්‍රය වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

4. පහත දැක්වෙන ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න. (ලකුණු 03)

(i) ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තිය සිදු වීමට පෙර කාලය හඳුන්වන නම කුමක්ද?

(ii) ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තියෙන් පසු කාලය හඳුන්වන නම කුමක්ද?

(iii) බුදුන් වහන්සේගේ මහා පරිනිර්වාණය සිදු වූ දින සිට ආරම්භ වූ වර්ෂ ක්‍රමය කුමක්ද?

3. ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන 03ක් නම් කර ඉන් එකක් නිදසුනක් මඟින් දක්වන්න (ලකුණු 05)

(03) 1. පෘථිවිය සෑදී ඇති බවට පිළිගත් පොදු විශ්වාසය කුමක්ද? (ලකුණු 02)

2. පහත දැක්වෙන ප්‍රශ්න සඳහා වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න. (ලකුණු 03)

(ප්‍රොකායෝටි බැක්ටීරියාව, ඔපබිනියා, සිලුරියන් යුගය, පැලියොසොයික යුගය, මහාහිම යුගය)

(i) පෘථිවිය සෑදී අවසන් වූ පසු එහි බිහි වූ ජීවයක් සහිත පළමු දෙය හැඳින්වෙන නම කුමක්ද?

(ii) කැණ්ඩාවෙන් සොයා සොයා ගන්නා ලද ආහාර ගැනීමට මුඛයක් සහ ඇස් පහක් පිහිටා තිබූ මුහුදු පතුලේ ජීවත්වූ සත්ත්වයා කවුද?

(iii) මුලින් ම ගොඩබිම පැතිරී ගිය ශාක වර්ග බිහි වූ යුගය වන්නේ කුමක්ද?

3. මධ්‍යශිලා යුගයේ මානවයාගේ ජීවන රටාවේ ලක්ෂණ 03ක් ලියන්න. (ලකුණු 03)

4. පුරාශිලා යුගයේදී මිනිසාගේ ජීවන රටාවේ ලක්ෂණ 04ක් නම් කරන්න. (ලකුණු 04)

(04) 1. නව ශිලා යුගයේ මිනිසාගේ හැකියාවන් 02ක් නම් කරන්න. (ලකුණු 02)

2. මුල් කාලයේ මිනිසා ඉදි කළ නිවාසවල ලක්ෂණ 03 ක් ලියන්න. (ලකුණු 03)

3. මිනිසා ගොවිතැනට යොමු වීම නිසා ජීවන රටාවේ සිදුවූ වෙනස්කම් 03ක් ලියන්න. (ලකුණු 03)

4. පහත සඳහන් විශේෂ ක්‍රියාකාරකම සිදු කරන ලද මානවයින් වර්ගන් තුළ දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න.

(හෝමෝ හැබිලස්, හෝමෝ ඉරෙක්ටස්, හෝමෝ නියාන්ඩතාලෙන්සිස්, හෝමෝ සාපියන්, ඔස්ට්‍රලෝපිතිකස්)

(i) ගින්දර භාවිත කිරීමට පුරුදු වීම

(ii) විශාල සතුන්ගේ ඇටකටු භාවිත කර නිවාස ඉදිකිරීම

(iii) ගලකින් තවත් ගලකට ගසා ඉන් පතුරක් කඩා ඉවත් කොට මුවහත් මුහුණතක් සාදා ගැනීම

(iv) එකිනෙකා අතර අදහස් හුවමාරු කර ගැනීමට හැකි භාෂාවක් භාවිත කිරීම (ලකුණු 04)

(05) 1. ශිෂ්ටාචාරයක් යන කුමක්ද? (ලකුණු 02)

2. මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයට අයත් ජනයාගේ ප්‍රධාන යැපීම් ක්‍රම දෙක නම් කරන්න. (ලකුණු 02)

3. මෙසොපොතේමියානු සමාජය කොටස් බෙදී තිබූ කොටස් හතර නම් කරන්න. (ලකුණු 04)

4. පහත සඳහන් කාර්යයන්වලට අධිපති දෙවියන් හෝ ස්ථානය මෙසොපොතේමියානු ශිෂ්ටාචාරය ආශ්‍රයෙන් දක්වන්න. (ලකුණු 04)

(i) දේව මණ්ඩලයේ ප්‍රධානියා

(ii) පොළොවට අධිපති දෙවියා

(iii) සුළඟට සහ ගොවිතැනට අධිපති දෙවියා

(iv) දෙවියන්ට පුද පූජා පැවැත්වීමට තැනූ දේවාල

(06) 1. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන රටවල් 02ක් නම් කරන්න. (ලකුණු 02)

2. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගර 03ක් නම් කරන්න. (ලකුණු 03)

3. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉතා දියුණු නාගරික ලක්ෂණවලින් පැවති බවට පෙන්වන සාධක 03ක් ලියන්න. (ලකුණු 03)

4. ශිෂ්ටාචාරය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ලකුණු 04)

(i) පළමුවරට රබර් බෝලයක් සාදා ලද ශිෂ්ටාචාරය කුමක්ද?

(ii) 'ගංගා දෙකක් මැදි වන සේ පිහිටි රට' යනුවෙන් හඳුන්වන ශිෂ්ටාචාරය කුමක්ද?

(iii) මෙසොපොතේමියාවේ උතුරු කොටසේ ජීවත් වූ දක්ෂ වෙළෙන්දන් හඳුන්වන්නේ කුමන නමකින්ද?

(iv) පූජක රූප ලෙස සඳහන් මූර්තිය අයත් වන්නේ කුමන ශිෂ්ටාචාරයකටද?

(07) 1. ඊජිප්තු ශිෂ්ටාචාරය තුළ පිරමිඩ භාවිත කරන ලද්දේ කුමක් සඳහාද? (ලකුණු 02)

2. ඊජිප්තු වැසියන් ලොවට දායාද කළ විශිෂ්ට නිර්මාණ 03ක් නම් කරන්න. (ලකුණු 03)

3. චීන ශිෂ්ටාචාරය විසින් ලෝකයට හඳුන්වා දුන් දායාද 03ක් ලියන්න. (ලකුණු 03)

4. ඊජිප්තු ශිෂ්ටාචාරය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ලකුණු 04)

(i) නොයෙක් සතුන්ගේ සහ භාණ්ඩවල රූප භාවිත කොට නිර්මාණය කළ අක්ෂර හැඳින්වෙන්නේ කුමන නමකින්ද?

(ii) ලෝකයේ තිබෙන පුදුම හතෙන් එකක් ලෙස සැළකෙන පිරමීඩය කුමක්ද?

(iii) ඊජිප්තුව පාලනය කරන ලද බිසවකගේ නමක් සඳහන් කරන්න.

(iv) මම්කරණ ක්‍රමය යනු කුමක්ද?

REGISTRAR
De Mazenod College
Kandana.